# සමුපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
## Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


මගේ අංකය / எனது இல / My No. } SP/CEC/1/O/5 — ඔබේ අංකය / உனது இல / Your No. } — දිනය / திகதி / Date } 2023.06.13

උපදෙස් ලිපි අංක 2023(3)

දකුණු පළාතේ සියලුම සමුපකාර සමිතිවල සභාපතිවරුන් වෙත,

<u>**විනය පරීක්ෂණ නිලධාරී මහතෙකු පත්කර ගැනීම.**</u>

සමිතිවල සේවය කර විවිධ හේතු මත සේවය තහනම් කරනු ලබන සේවකයින්ගේ විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා විනය පරීක්ෂණ නිලධාරීන් පත්කර එවන ලෙස සමිතිවලින් කරනු ලබන ඉල්ලීම හා බැදේ.

02. එම ඉල්ලීම අනුව කොමිෂන් සභාව විසින් විනය පරීක්ෂණ නිලධාරී ප්‍රමුඛතා ලේඛණය අනුව පරීක්ෂණ නිලධාරියකු නම් කිරීමෙන් පසුව අදාල නිලධාරියා සම්බන්ධයෙන් සමිතිය සෑහීමකට පත්නොවන අවස්ථා කොමිෂන් සභාවට වාර්තා වී ඇත.

03. එවැනි අවස්ථාවක නම් කරන ලද විනය පරීක්ෂණ නිලධාරී මහතකු නැවත වෙනස් කිරීමේ දී අදාල නිලධාරී මහතා ඉතා අපහසුතාවයට පත්වන අතර,එමගින් කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ වරින් වර සංශෝධනය කිරීමට සිදුවේ.

04. එබැවින් යම් විනය පරීක්ෂණ නිලධාරියකු සම්බන්ධයෙන් විරෝධතාවයක් ඇත්නම් පරීක්ෂණ නිලධාරියකු පත්කරන ලෙස ඉල්ලීම කරනු ලබන අවස්ථාවේ දීම එය දන්වා එවන ලෙස කොමිෂන් සභාවේ නියෝගය පරිදි දන්වමි.

05. මින් ඉදිරියට විනය පරීක්ෂණ නිළධාරියකු නම් කල පසු එම නිළධාරියා වෙනස් කිරීම සඳහා කොමිෂන් සභාවට ඉල්ලීම් ඉදිරිපත් කිරීමෙන් වලකින ලෙසද කාරුණිකව දන්වමි.

ජයන්ත ජී. ලියනගේ
ලේකම් (වැ.බ.)
සමුපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත

ජයන්ත ජී. ලියනගේ
ලේකම්(වැ.බ.),
සමුපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත -
1. ලේකම්, කෘෂිකර්ම,ගොවිජන සංවර්ධන ........ සමුපකාර අමාත්‍යාංශය - දැ.ගැ.ස.
2. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත - කරු.සමු.සං.ප්‍රා.නි. හරහා අදාල සමිති දැනුවත් කිරීම සඳහා.
3. දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට


ලේකම් / செயலாளர் / Secretary } 091-2232794
පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer } 091-2234279
කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax } 091-2234383
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site } www.cec.sp.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail } empcommicoopsp@sltnet.lk